# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1979 අංක 4 දරන රබර් පර්යේෂණ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1979 ජනවාරි මස 18 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1979 ජනවාරි මස 19 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ: ශත 15 යි. තැපැල් ගාස්තුව: ශත 25 යි.

## 1979 අංක 4 දරන රබර් පර්යේෂණ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1979 ජනවාරි මස 18 වන දින]

එල්.ඩී.—ඕ. 79/78

### රබර් පර්යේෂණ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 1979 අංක 4 දරන රබර් පර්යේෂණ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

439 වන අධිකාරයේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 35 දරන පනතින් සංශෝධිත රබර් පර්යේෂණ ආඥාපනතේ 6 වන වගන්තියේ (1) වන උප වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් වැඩිදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ උපවගන්තියේ (අ) ඡේදයෙහි "සත හතරයි දශම හතරක අපනයන තීරු බද්දක්" යන යෙදුම වෙනුවට "සත අටක අපනයන තීරු බද්දක්" යන යෙදුම ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඇ) (අ) ඡේදය මගින් නියම කරනු ලැබූ තීරු බදු ප්‍රමාණය වෙනස් කිරීම හෝ නියම කරනු ලැබූ තීරු බද්ද පරිච්ඡින්න කිරීම හෝ පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින් කවර වූ හෝ අවස්ථාවක දී කළ හැකි ය. එවැනි යෝජනා සම්මතයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරනු ලැබූ දින සිට එය ක්‍රියාත්මක විය යුතු ය.".

ඒ 38284—11,250 (78/12)

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.